NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | නර්තනය | 1.3 ඒකකය |
|---|---|---|

## කඩු/මෝල්ගස් නැටුමක් නිර්මාණය කරමු.

- **හිස්තැනට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. මෑත කාලයේ දී දේශීය ගැමි නැටුම් අතරට එක්වූ ජනප්‍රිය නර්තන අංගයකි, ...............

    (1). රබන් (2). සවරං (3). මෝල්ගස් (4). කඩු

02. පුරුෂ පක්ෂය අතර ජනප්‍රිය නර්තන අංගයක් ලෙස ............... නර්තනය දැක්විය හැක.

    (1). රබන් (2). සවරං (3). මෝල්ගස් (4). කඩු

03. කාන්තාවන් පමණක් සහභාගි වන ගැමි නැටුම් විශේෂයක් නොවන්නේ, ............... නැටුම ය.

    (1). කළගෙඩි (2). පතුරු (3). කුලු (4). මෝල්ගස්

04. වේදිකාව භාවිත කිරීමේ දී තල ............... පිළිබඳව ඉගැන්වේ.

    (1). 3 ක් (2). 4 ක් (3). 5 ක් (4). 6 ක්

05. මෝල්ගස් කවි මුල් කාලයේ දී ගායනා කර ඇත්තේ ............... ය.

    (1). ශාන්තිකර්මවලදී (3). රාජ සභාවේදී

    (2). මංගල උත්සවවලදී (4). පෙරහැරවලදී

(ලකුණු 2×5 = 10)

- **සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.**

01. ......................................... කෘෂිකාර්මික ජන සමාජයේ දී වී කෙටීමට ගන්නා උපකරණයකි.
02. කඩු සරඹ නර්තනය සඳහා ......................................... කවි භාවිත කරයි.
03. මෝල්ගසක දිග ප්‍රමාණය කවිවලට අනුව ......................................... වියතකි.
04. මෝල්ගසේ දෙකොණ සාදා ගන්නේ ......................................... යොදා ගෙනය.
05. කඩු නර්තනය සඳහා කඩුව සමග යොදා ගන්නා අනෙක් උපකරණය ......................................... යි.

(ලකුණු 2×5 = 10)

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. කාන්තාවන් විසින් පමණක් ඉදිරිපත් කර ගැමි නැටුම් 3ක් නම් කරන්න.
02. පුරුෂ පක්ෂයට වඩා සුදුසු ගැමි නර්තනාංග 3ක් සඳහන් කරන්න.
03. ජන නැටුම් සඳහා භාවිතා කළ හැකි රංග භාණ්ඩ 6ක් (හයක්) නම් කරන්න.
04. ගැමි නැටුමක දී දැකගත හැකි විශේෂතා 3ක් සඳහන් කරන්න.
05. කමතේ දී හෝ කුඹුරේ දී භාවිත කරන හා නර්තනය සඳහා ද යොදා ගන්නා උපකරණ 3ක් නම් කරන්න.
06. ගැමි නැටුම් සඳහා භාවිත කරන ඇඳුම් පැළඳුම් පිළිබඳව ඔබේ අදහස් වාක්‍ය 3කින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 6×5 = 30)